# මැතිවරණ මූල්‍යකරණය වාසිසහගත ලෙස භාවිත කිරීමට දේශපාලන පක්ෂ හුරුවිය යුතුයි

අද අපි සාකච්ඡාවට භාජනය කරනුයේ ඉතාමත්ම කාලීන වැදගත්කමක් ඇති තේමාවකි. ප්‍රජාතන්ත්‍රවාදී සමාජය තුළ විශේෂයෙන්ම මැතිවරණ වියදම් පාලනය කෙරෙහි ඇත්තේ විශාල වැදගත්කමකි. සමස්ත ලෝකයම වාණිජකරණය වීම තුළ මැතිවරන වියදම් ද පාලනය කළ යුතුය යන්න ප්‍රමුඛතම සංවාද තේමාවක් වී ඇත. මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය හා පැෆ්රල් සංවිධානය මේ පිළිබඳ පුළුල් සංවාදයක් දියක් කොට තිබීම සතුටට කරුණක්. මෙරටේ මැතිවරණ ක්‍රියාදාමය සවිමත් කරන්න සිවිල් සංවිධාන දක්වා ඇති කාර්යය භාරය අවතක්සේරු කිරීමට නොහැකි. මම කැමතියි ඔබට ඉතා ආඩම්බරයෙන් පවසන්න ඉහත සංවිධාන දෙක මැදිහත්ව සංවිධානය කළ මෙවැනි වැඩසටහනක් පැවැත්වුණා මැතිවරණ කොමිෂන් සභාවේ මූලිකත්වයෙන් මෑතකදී. එහිදී මැතිවරණ වියදම් පාලනය ගැන නීතියක් රටේ සම්මත කරලා නැති වුනත්, දේශපාලන පක්ෂ නියෝජිතයින් ඒකමතිකව යෝජනාවක් සම්මත කරමින් මැතිවරණ කොමිසම වෙත දැනුම්දුන්නා ළඟඑන පළාත් පාලන ඡන්ද විමසීම් වලදී ඒ ඒ අපේක්ෂකයින්ගේ වියදම් මැතිවරණ කොමිසමට ලබා දිය යුතුය යනුවෙන්. නීතියක් නැති වුනත් අපි මේ වන විට වැඩපිළිවෙලක් ආරම්භ කොට තිබෙනවා.

මම හිතන්නේ මෙය හොඳ ප්‍රවණතාවයක්. වියදම කියන එක අසීමිතයි. ඒ කියන්නේ ලංකාවේ 1977 ඇති වූ ආර්ථික වෙනස්කම් සහිත සමාජ වපසරිය තුළ මේ රටේ මැතිවරණ ව්‍යාපාර අසීමිත දූෂිත ව්‍යාපාර බවට පත්වී තිබෙනවා. නමුත් ලංකාවේ දේශපාලන පක්ෂ හැම එකක්ම ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. ලංකාවේ දේශපාලන පක්ෂ හැම එකක්ම නිදහස් හා සාධාරණ මැතිවරණයක් ගැන කථා කරනවා. ලංකාවේ දේශපාලන පක්ෂ වලට නිදහස් හා සාධාරණ මැතිවරණයක් සහතික කරන්න ඕනේමනම් සහ ඒ වගේම ලංකාවේ දේශපාලන පක්ෂ වලට ප්‍රජාතන්ත්‍රවාදය සහතික කරන්න අවශ්‍ය වෙනවානම්, ඒ සඳහා දේශපාලන පක්ෂ වල වියදම් සීමා කිරීමේ නියමයන් වලට එකඟතාවයක් දක්වන්නට ඕනේ.

දැනට කෙරෙන්නේ, මැතිවරණ දෙපාර්තමේන්තුව පැවති සමයේ සිදුවූවාක් මෙන්ම මැතිවරණ කොමිසම අදාළ මැතිවරණ වියදම් අවුරුදකට සැරයක් ගෙන්වා ගැනීම පමණයි. එලෙස ලැබෙන ගිණුම් වාර්තා පවා නිසි විමර්ශනයකට ලක් වෙන්නේ නැහැ. ඒ නිසා මම ඉල්ලා සිටිනවා සභාපතිතුමාගෙන් මැතිවරණ කොමිසම තුළ ඒකී වාර්තා විමර්ශනයට වෙනමම ඒකකයක් පිහිටුවන ලෙස. එවැනි උත්සාහයකින් පමණයි රටෙහි විනිවිදභාවය ඇතිකරන්න පුළුවන් වෙන්නේ.

ඊළඟ කාරණාව, මැතිවරණ වියදම් පාලනයට වෙනත් රටවල් අනුගමනය කරන ප්‍රවේශ කෙතරම් දුරට අප වැනි රටකට ආදේශ කරගත හැකි ද යන්න. ඉන්දියාව හා බංගලාදේශය වැනි රටවල් යම්තාක් දුරකට මෙහි සාර්ථකත්වයක් ලබා තිබෙනවා. මා දිගු කළක් තිස්සේ දේශපාලන පක්ෂයක සාමාජිකයෙක් ලෙස කටයුතු කරන බැවින් පක්ෂයක් තුළ තිබිය යුතු විනිවිදභාවය කෙතරම් වැදගත් දැයි අවබෝධාත්මකයි. එමනිසා අප මෙහිදී උදාකර ගත යුත්තේ දෙපක්ෂයකම ජය ගත හැකි වාතාවරණයකුයි.

මුදල් විරහිතව මැතිවරණ කළ නොහැකියි. එහෙත් ඒ මුදල් ලැබෙන්නේ කොහෙන්ද යන්න ඡන්දදායකයා දැනගත යුතුයි. ඒ පිළිබඳ විවාදයක් නැහැ. අතීතයේ පැවති මැතිවරණ වියදම් වාර්තාකරණය වැනි ක්‍රමවේදයකට හෝ යෑම ආරම්භක පියවරක් ලෙස ඉතා වැදගත්. එකළ අපිට මතකයි ජයග්‍රාහී පක්ෂයේ ලේකම්වරයා මැතිවරණ නිලධාරියාට වියදම් ලේඛණයක් යවන බව. ඔවුන් එය සිදුකළේ ඉතා ඕනෑකමින් සහ නීතිය හමුවේ මනා හික්මීමක් පළ කරමින්. මෙය අතීතයේ පැවති සම්ප්‍රදායක් සහ වටිනා නීතියක් බැවින් එය සමඟ නැවතත් අනුගතවීම ලංකාවේ දේශපාලන පක්ෂ වලට එතරම් අපහසු කරුණක් නොවේ.

***මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය වසර 2016 දෙසැම්බර් මස 31 වැනි දින කොළඹ දී, මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණය හා සබැඳිව පවත්වන ලද වැඩසටහනේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙහි මධ්‍යම කාරක සභික සහ මැතිවරණ කොමිෂන් සභාවෙහි පිහිටුවා ඇති දේශපාලන පක්ෂවල නියෝජිතයන්ගෙන් සැදුම්ලත් ස්ථාවර කමිටුවෙහි ජ්‍යෙෂ්ඨ සාමාජික නීතිඥ චම්පාණී පද්මසේකර මහතා දක්වන ලද අදහස්වල සංක්ෂිප්තයකි.***